රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 9/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1988.03.30 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ට පශ්චාත් උපාධි පාඨමාලා සඳහා අවස්ථා

රාජ්‍ය පරිපාලන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය තෝරා ගන්නා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් එකවර සසළොස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් මාස දහ අටක කාලයකට පූර්ණ වැටුප් සහිත නිවාඩු මත මුදා හැරිය හැක.

2. මෙම නිලධාරීන්ගේ රාජකාරි කටයුතුවලට අහිතකර ලෙස බලනොපාන පරිදි, මුදාහැරීම් පහසු කිරීම්වස්, සෙනසුරාදා දිනයන්හි සහ සතියකට දෙවරක් දිවා කල්හි වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට එම ආයතනය එකඟත්වය පළ කර ඇත. පාඨමාලාව සඳහා නිලධාරීන් තෝරා ගැනීම ආයතනය කරනු ඇත. මේ සඳහා කැමැත්තක් දක්වන නිලධාරීන් තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් කෙලින්ම අදාල ආයතනය වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඒ ඒ අමාත්‍යාංශයේ පුනරාවර්තන වැය ශීර්ෂ යටතේ පවත්නා මුදල් ප්‍රතිපාදන අනුව නිදහස් කලහැකි නිලධාරීන් සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. කෙසේ වෙතත් 1988 වර්ෂයට අවශ්‍ය නිලධාරීන් වෙනුවෙන් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශයට අනුමත කර ඇති වැය ශීර්ෂ වලින් දරනු ලැබේ.

3. මෙම අනුග්‍රහය භුක්ති විඳින නිලධාරියෙකු දේශීය පාඨමාලා සම්බන්ධයෙන් දැනට විධිවිධාන සැලසී ඇති පරිදි, අවුරුදු තුනක කාලයක් රජය යටතේ සේවය කිරීමට ගිවිසුමකට එළඹීම අවශ්‍යය.

4. දැනටමත් මෙරට හෝ පිටරටක දී හෝ මාස නවයක් හෝ ඊට වැඩි කාලයක් හෝ පුහුණුවක් ලබා ඇති නිලධාරියකුට මෙම අනුග්‍රහය ලබා දෙනු නොලැබේ.

Siriwardhana

( ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන )
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.